VIDUS 2-3-19

# විද්‍යාඥයාගෙන් සමාජයට ඉටුවිය යුතු කාර්යභාරය

**ඔස්මන්ඩ් ජයරත්න**

*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය*

**ග්‍රන්ථ සමාලෝචනය**

**ඒ. රහ්මාන්: ත්‍රිවේනි: විද්‍යාව, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජවාදය**
(ඉන්දියානු උසස් අධ්‍යාපන ආයතනය, සිම්ලා)

ප්‍රධාන වශයෙන් ජාතියක සමාජ ජීවිතයේ හා සංවර්ධන ක්‍රියාවලිය තුළ විද්‍යාවේ හා තාක්ෂණයේ කාර්යභාරයට හා අනුකලනයට අදාලවන විද්‍යා ප්‍රතිපත්තිය, මෑතකදී විද්‍යාවේ ඉතිහාසය, සමාජ – ආර්ථික විෂය සමඟ විද්‍යාවේ අන්තර් සම්බන්ධතා හා සමාජ විපරිණාය තුළ විද්‍යාඥයන්ගේ කාර්යභාරයද ඇතුලත් විවිධ අංගවලින් යුතු අධ්‍යයනයක් බවට පත්ව ඇත. සංවර්ධිත රටවල විද්‍යාව හා තාක්ෂණය ශීඝ්‍රයෙන් දියුණුවීයාම නිසා පැරණි ගතානුගතික සමාජ ව්‍යුහයන්හි එල්බගත් රටවලට උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ දීමට සිදුවී ඇත. ''තුන්වන කාර්මික විප්ලවය'' යයි බොහෝ දෙනා විසින් හඳුන්වනු ලබන මෑත සිදුවූ කර්මාන්ත විප්ලවය හේතුකොටගෙන, මනුෂ්‍ය වර්ගයාගේ සෑබෑ ශක්තිය මල්පල ගැන්වීමක් සිදුවූ අලුත් බල ශක්තීන් හා තාක්ෂණ ක්‍රම ඉලෙක්ට්‍රෝන විද්‍යාව හා ස්වයංකරණය පදනම් කරගෙන පහළවීම නිසා අලුත් දේවල් සොයා ගැනීමට හා සැමදෙනාටම ඇති තරම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමටද විවේක සුවය විඳීමටද ඒකාකාරීභාවයෙන් මිදී වාසනාවන්ත ජීවිත ගතකිරීමටද මාර්ගය උදව් ඇත. අනික් අතින් බලන කල්හි සමාජීය රාමුව මගින් සීමා කරන ලදුව හා ඒ සමඟ අන්‍යොන්‍ය බලපැවැත්මෙන් යුතු මෙම සාඩම්බර සංවර්ධනවලින් මිනිස් වර්ගයා සමෘධිය තුල දුගීබවට පත්වීමේද, පුද්ගලික නිදහස නැතිවී තමන් පාවාදුන් තත්වයකට පත්වීමේද න්‍යෂ්ටික ලෝක විනාශයකට මුහුණ දීමේද තර්ජනයක් ඇති වී තිබේ.

රහ්මාන් ඉදිරිපත් කර ඇති මතය නම් විද්‍යාව හා තාක්ෂණය සමාජය හා එහි වටිනාකම්වල පාලනයට යටත්වන අතර, විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව හේතුකොටගෙන සමාජය තුළ ඇති වටිනාකම් හා සංකල්ප විශාල ලෙස වෙනස්වන බවය.

මෙබඳු අවස්ථාවකදී විද්‍යාඥයාගේ කාර්යභාරය කුමක්විය යුතුද? විද්‍යාඥයා සිය රසායනාගාරය සහ අනිකුත් විද්‍යාඥයන් සමග ආශ්‍රයට පමණක් සීමා විය යුතුද නැතහොත් අවසානයේදී ඔහුගේ කටයුතු නිර්ණය කරන්නාවූ සමාජීය – දේශපාලන ක්‍රියාවලීන් සම්බන්ධයෙන්ද ඔහු සැලකිලිමත් විය යුතුද? බොහෝ විට ශ්‍රී ලංකාවේ විද්‍යාඥයෝ ඉහත මුලින් සඳහන් තත්ත්වයට නැඹුරු වන අතර, ඔවුහු විද්‍යාවේ කාර්යභාරය අවබෝධ කර නොගත් එමෙන්ම ජාතික ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා එය නොසලකා හරින ආණ්ඩු ක්‍රමවල ප්‍රතිපත්ති දෙස විශ්මයෙන් බලා සිටිති. මෙය ඌන සංවර්ධිත 'තුන්වන ලෝකයේ' රටවලට මුහුණ පෑමට සිදුව ඇති විශේෂ ප්‍රශ්නයකි. එසේවුවත් මෙම උභතෝකෝටික පැනය සංවර්ධිත රටවලද මතු වී ඇත. ලොස් ඇලමොස්හි පරමාණු බෝම්බයේ පුරෝගාමියා වූ රොබට් ඔපන්හයිමර්ගේ හෘදය සාක්ෂි අර්බුදය හේතුවෙන් පෙන්ටගොන් ප්‍රතිපත්ති සැලසුම්කරන්නන්ගේ පලිගැනීමට ඔහු ගොදුරුවීමේ ඛේදවාචකය මීට නිදසුනකි. හිරෝෂිමා හා නාගසාකි ප්‍රහාරවලට අනුබල දුන් 'ජලකර බෝම්බයේ පියා' ලෙස සැලකෙන එඩ්වර්ඩ් ටෙලර් ගේ කාර්යාවලියෙන් සනාථ වනුයේ විද්‍යාවට පමණක් කැපවූ කාර්ය කලාපයක් තුළ ජීවත්වීම නිසා විද්‍යාඥයන් කූට දේශපාලනඥයන්ගේ ඉත්තන් බවට පත්වන බව හා ඔවුන්ගේ බුද්ධියෙන් ගතයුතු ප්‍රයෝජන ගැන මුලාවකට පත්වන බවය. ගොරෝසු හා හැඩි දැඩි හා ධනවත් ජාතීන් අතලොස්සක් බහුතර මිනිස් වර්ගයා සූරාකෑමේ අරගලවලින් ගහණ විසිවන සියවසෙහි, විද්‍යාත්මක මධ්‍යස්ථභාවය ගැන කථාකිරිම මිථ්‍යාවකි. නැතිනම් මායාවකි. විද්‍යාව හා තාක්ෂණය සමාජ–දේශපාලන ක්‍රියාවලියෙන් වෙන් කිරීමට හා තනිකිරීමට කිසියම් තැනක් ඇතද, විවිධ තාක්ෂණ ක්‍රම හා ආයෝජනවල අරමුණු හා පර්යේෂණ ඉලක්ක තෝරා ගන්නා ප්‍රශ්නය අවසාන ලෙස විග්‍රහ කර බැලුවහොත් එම අරමුණු සියල්ල සමාජ හා දේශපාලන ඒවා බව පැහැදිලිය.

විද්‍යාවේ අරමුණ හා ඉලක්කය අමුතුම ස්වරූපයක සමාජ රටාවක් බිහිකිරීම නම්, සංස්කෘතිය, අගැයුම් හා සමාජ සංවිධාන මූලික වශයෙන් වෙනස් කළ යුතු නම්, හා තීරණවල තර්කානුකූල භාවය සංස්කෘතියේ හා සමාජයේ ලක්ෂණයක් විය යුතු නම්, දැනට පවත්නා සමාජීය රාමුව හා විද්‍යාත්මක හා තාක්ෂණික ඉලක්ක මගින් එය සාක්ෂාත් කරගත හැකි නොවේ. මේ දෙකම සහමුලින්ම වෙනස්කළ යුතුය. ''විද්‍යාත්මක දැනුම, නව සංස්කෘතියක, සමාජ සංවිධානයක හා දේශපාලන තීරණ ගැනීමෙහිලා පදනම විය යුතුය. විද්‍යාඥයන් විසින් මූලික පරිනාමයක් සමාජය තුල ඇතිකිරීමේ ව්‍යාපාරයක් බවට විද්‍යාව පත්කළ යුතුය.''

රහ්මාන් විසින් විද්‍යාඥයන්ගේ ආකල්පයන්හි ප්‍රකට ද්විධාකරණය පැරණි භාරතයේ චාර්වාකගෙන් ආරම්භ කොට ග්‍රීසියේ අයෝනියන්වරුන්ගේ දර්ශනය සමග සසඳා සමකාලීන සමාජ දාර්ශනිකයන් දක්වා ඓතිහාසික පසුබිමක් තුළ විශ්ලේෂණය කරනු ලැබේ. විද්‍යාව පිළිබඳ ඓතිහාසික විමර්ශනවලින් වැඩි හරියක්ම සිද්ධාන්තවලට පමණක් සීමාවන බැවින් එක් යුගයක සමාජීය, සංස්කෘතිය හා දේශපාලන ජීවිතය හා විද්‍යාව හා තාක්ෂණය අතර අන්‍යොන්‍ය බලපැවැත්ම පිළිබඳ අවබෝධයක් ඉන් ලබාගතහැකි නොවේ. රහ්මාන්ගේ කෘතියෙහි විචක්ෂණ විශ්ලේෂණයෙන් පිරවීමට අදහස් කර ඇති විවරය මෙයයි.

පැරණි ඉන්දියාවේ මෙන්ම ග්‍රීසියේද, සමාජ ක්‍රියාවලීන් අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම යොදගත් අය හා සමාජ සංවිධානයෙහි ලා විද්‍යාත්මක දැනුම උපයෝගී කරගැනීමට අපේක්ෂා කළ අය හා විද්‍යාවේ විෂය පථයෙන් සමාජය බැහැර කිරීමට නැඹුරුවූ අයද අතර තියුණු අරගලයක් පැවතියේය. මෙම අරගලය ඉන්දියාවේ චාර්වාක හා බ්‍රාහ්මණ දර්ශනවාදීන් අතරද ග්‍රීසියේ අයෝනියානු හා පසුව එපිකියුරියානු දර්ශන හා ප්ලේටෝ වාදයට අයත් මතධාරීන් අතරද වර්ධනය විය.

ප්‍රතිවිරුද්ධ මත අතර මූලික වෙනසකට තුඩුදුන් ප්‍රශ්නය වූයේ වැසියා කෙසේ පාලනය කළ හැකිද යන්නයි. බ්‍රාහ්මණ හා ප්ලේටෝ වාද අනුව සමාජ සංවිධානය එලදායී වීමට නම් මිනිසුන් කීකරු කරගෙන අවනත කරවා ගත යුතුය. ඒ සඳහා මිථ්‍යා මත, විශ්වාස හා දඬුවම් මගින් ඔවුන් තුළ බිය උත්පාදනය කළ යුතුය. එමනිසා විද්‍යාව සමාජයෙන් වෙන්කර විශිෂ්ඨ ජන කොට්ඨාශයකට පමණක් සීමාවූ විෂයයක් බවට පත්කළ යුතුවිය. ඇත්ත වශයෙන් මෙම වාද දෙකෙන්ම නියෝජනය වූයේ ධනයට හා දැනුමට ඒකාධිකාරයක් ලබාගත් පටු පාලක පක්ෂයේ ඕනෑ එපාකම්ය. බහු ජනතාවට පොදුවූ ශාරීරික ශ්‍රමය හෙළා දුටු ඔවුහු මනස ප්‍රභව කොටගත් එක්තරා භාව මාත්‍රයක්, මූල සත්‍යයක් හෝ කල්පිතයක් බදුගෙන සිටීමට වඩා ප්‍රිය කළහ. සමාජ පසුබිමේ ස්වභාවය හේතු කොටගෙන උද්ගත වූ මෙම ආකල්පය ග්‍රීක විද්‍යාව තුළින් පිළිබිඹු වේ.

මිනිසා පාලනය කරනු වෙනුවට, සංසිද්ධි හා සොබා දහමේ රීති පිළිබඳ අවබෝධය තුළින් මිනිසා ලවා යම් යම් වැඩ කරවා ගැනීමට පෙළඹවීම් කළ හැකිය යන මතය චාර්වාකයන් හා අයෝනියානුවන් විසින් දරණ ලදී. මෙම කාර්යය අරබයා ඔවුහු, සමානාත්මතාවය මත පදනම්වූ හා දූනුම පතළ කිරීමෙහි නියැලුණු සහෝදර සමිති පිහිටුවා ගැනීමට උත්සාහ දැරූහ. මේ සඳහා ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ පූජකවරුන්ගේ වංචාකාරී කටයුතු, මිථ්‍යා කථා හා මිනිස් කටයුතුවලට දෙවියන්ගේ බලපෑම ආදිය පිළිබඳ ඇති තතු අනාවරණය කිරීම විය. මෙබඳු මත දැරීම නිසා ඔවුහු තාඩන පීඩනවලට ගොදුරු වූහ.

විද්‍යාත්මක කටයුතු කෙරෙහි සමාජ ආකල්පයන්ගේ බලපෑම මෙම දර්ශනිකයන්ගෙන්ද ප්‍රකට වේ. ප්ලේටෝවාදීන්ගේ කටයුතු වල මෙන්ම මොවුන්ගේ කටයුතුවලද නිරීක්ෂණයට හා පර්යේෂණයට ඉතා වැදගත් තැනක් ලැබිණ. මේ ආකාරයෙන් පෛතගරස් සංගීත ධ්වනිය පිළිබඳ අත්හදා බැලීම් කළේය. පූනීලයක් දියෙහි ගිල්වීමෙන් එහි වායුව ඇති බව එම්පිඩෝක්ලීස් ඔප්පු කළේය.

අයෝනියානු හා පසුව එපිකියූරියානු ආභාෂය යටතේ, විද්‍යාව රසායනාගාරයට පමණක් සීමාවූ ශික්ෂණයක් ලෙස කල්පනා නොකරන ලදී. මුළු මහත් ස්වාභාවික හා සමාජ සංසිද්ධිය පුරා පැතිරීගිය එකක් ලෙස එය සැලකිණ. සමාජයේ විශිෂ්ඨ ජනයාට හිමිව පැවති වරප්‍රසාද සුරකිනු වස් විද්‍යාව බහුජනතාවගෙන් වෙන් කළ අයෝනියානු දර්ශනිකයන් මෙන් නොව මොවුහු විද්‍යාවේ තර්කාන්විත භාවය තුළින් සමාජය හැඩගැස්වීමට උත්සාහ කළෝය.

වර්තමාන විද්‍යාත්මක සම්ප්‍රදාය මගින් නැවතත් නිරීක්ෂණාත්මක හා අත්හදා බැලීම් ශිල්ප ක්‍රම රසායනාගාරයට පමණක් සීමා කිරීමට උත්සාහයක් ගන්නා බව පෙනේ. මෙය පැහැදිලි කිරීමට රහ්මාන් අපූරු කල්පිතයක් මෙසේ ගෙනහැර දක්වා ඇත:

''කොපර්නිකස්ගේ සිද්ධාන්තයෙන් පැන නැගි ආන්දෝලනය හා එයට පක්ෂව කථාකිරීම නිසා ගැලීලියෝට පැනවූ දඬුවම හේතු කොටගෙන විද්‍යාඥයන්ට වැදගත් සමාජ ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදුවිය. එනම්: ආගමික හා සමාජ දර්ශනවාදයන් සමග ගැටෙන්නාවූ සිද්ධාන්තයන්ගෙන් පැන නගින සමාජ ප්‍රශ්න කෙසේ විසඳිය හැකිද යන්නයි. මේ සඳහා ඩේකාට් විසඳුමක් සොයා ගත්තේය. එය ගැලවීම් මාර්ගයක් ලෙස හැඳින්වීම වඩා උචිතය. එනම් ගැලීලියෝගේ දඬුවම පිළිබඳ පුවත ඇසූ ඔහු ලෝකය භෞතික හා සදචාරාත්මක වශයෙන් දෙකකට බෙදා වෙන්කළේය. භෞතික ලොව විද්‍යාව පිළිබඳ නීති ක්‍රියාත්මක වන අතර සදචාරාත්මක ලොව ආගමික ආඥා බලපැවැත්වෙනු ඇත. බේකන් පටන් අද දක්වා වෙනත් නොයෙකුත් අය කොතරම් වෑයම් කළද සමකාලීන විද්‍යාවටද මෙය උරුම වී ඇති අතර යථෝක්ත තීරණයේ රාමුව ඇතුලත එය දැනුදු ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාව බඳු තුන්වන ලෝකයට අයත් රටවල විද්‍යාත්මක ප්‍රජාව බටහිර විද්‍යාත්මක හා සංස්කෘතික සම්ප්‍රදායයන් කෘත්‍රිම ලෙස අප වෙත පවරාගෙන, ධනවාදී ලෝකයේ පවතින මේ විද්‍යා ද්විධාකරණය (දෙකට බෙදීම) එලෙසින්ම තවමත් පවත්වාගෙන යති.

අද විද්‍යාඥයන් කොතෙක්දුරට එක්ටැම් ගෙවල්වල සමාජයෙන් ඈත්වී කල්ගත කිරීමට කැමැත්තක් දක්වූවද ඔවුන්ගේ පර්යේෂණ නිසා සමාජයට ඇතිවන බලපෑමට මුහුණ දියයුතු තත්ත්වයක් ඇතිවී තිබේ. උදාහරණයක් වශයෙන් රැකියා ප්‍රශ්නයට ස්වයංක්‍රිය යන්ත්‍රසූත්‍ර බලපාන ආකාරය, පරිසර දූෂණය නැත්නම් නව අධිරාජ්‍යවාදය මගින් විද්‍යාව මිනිස් සංහතියම විනාශ කරදැමීමට දරණ උත්සාහයද, පැරණි චාර්වාකවාදීන් හා අයෝනියානු සම්ප්‍රදාය අනුව විද්‍යාඥයන්ද සමාජ විප්ලවකාරයන් විය යුතුද? නැත හොත් අඩු වශයෙන් ඔවුහු ඔවුන්ගේ රටවලට ආවේණික සමාජ හා දේශපාලන ප්‍රශ්න වටහාගෙන සමාජ රටාවෙහි මූලික ලක්ෂණ වෙනස් කිරීම සඳහා විද්‍යාත්මක විධි ප්‍රයෝජනයට නොගත යුතුද?

රහ්මාන්ගේ සහරාව විද්‍යා ප්‍රතිපත්ති අධ්‍යයනය පිළිබඳව ලියැවී ඇති සාහිත්‍යයට එක්වූ අගනා සංග්‍රහයකි. ඉන්දීය විද්‍යා, කාර්මික හා සංවර්ධන පර්යේෂණ ආයතනයේ සැලසුම් ප්‍රධානියා වශයෙන්ද, විද්‍යා ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා ජාත්‍යන්තර සභාවේ උප සභාපතිවරයා වශයෙන්ද විද්‍යා ප්‍රතිපත්තිය පිළිබඳව කටයුතු සඳහා ජාත්‍යන්තර කීර්තියක් දරණ පුද්ගලයකු වශයෙන්ද රහ්මාන් විසින් පළකොට ඇති විද්‍යාව හා සමාජය අතර ඇති සම්බන්ධතා පිළිබඳ ඔහුගේ අදහස් තුන්වන ලෝකයේ විද්‍යාඥයන්ට විශේෂයෙන්ම වැදගත් වේ. මෙම සංග්‍රහය ගැන කළ හැකි එකම විවේචනය නම් නිපාත පද ගිලිහී යාම වැනි මුද්‍රණ දෝෂ රාශියක් තිබීම කණගාටුවට කරුණක් බවයි. ඉදිරි මුද්‍රණවලදී මේ අඩුපාඩු නැති කර ගැනීමට උත්සාහයක් දරනවා ඇතැයි අපි විශ්වාස කරමු. එහෙත් මේ නිසා මෙම සංග්‍රහය තුළින් ඉදිරිපත් කොට ඇති නව චින්තා පහළ කරවන වටිනා අදහස්වලට පලුද්දක් ඇති නොවන්නේය.